සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

### දෙවන වාර පරීක්ෂණය - 2025
### Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **ක්‍රිස්තියානි ධර්මය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

- **1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

01. ''එම්මානුවෙල්'' යන නාමයේ අර්ථය වන්නේ,
(1) දෙවියන් වහන්සේ මුදන සේක ය. (2) දෙවියන් වහන්සේ අප සමඟ ය.
(3) දෙවියන් වහන්සේ උසස් කරන සේක ය. (4) දෙවියන් වහන්සේගේ ආලේපය ලැබීම ය.

02. ''ඔටු ලොම් වස්ත්‍රයක් ඇඳ ඉන වටා සම් පටියක් බැඳ සිටියේ ය.'' මෙම ප්‍රකාශය හා සම්බන්ධ පුද්ගලයා වන්නේ,
(1) ජේසුස් වහන්සේ ය. (2) මෝසෙස් තුමා ය.
(3) ජොසෙප් තුමා ය. (4) ස්නාවක ජොහාන් තුමා ය.

03. ජුදා චර්මච්ඡේදන පිළිවෙත කාගේ යුගය කරා දිව යන්නක් ද?
(1) ආබ්‍රහම් තුමාගේ යුගය කරා ය. (2) මොසෙස් තුමාගේ යුගය කරා ය.
(3) දාවිත් රජුගේ යුගය කරා ය. (4) ඊසාක් තුමාගේ යුගය කරා ය.

04. ස්නාවක ජොහාන් තුමාගේ කාලය වන විට ජුදා ආගමික උත්තම පූජක පදවිය ලබා සිටියේ කවුරුන් ද?
(1) පේදුරු ය. (2) ජාකොබ් ය. (3) කයාපස් ය. (4) සීමෝන් ය.

05. ජේසුස් වහන්සේ දේව රාජ්‍යය පදනම් කරගත් තම මෙහෙවර ප්‍රකාශ කිරීම ආරම්භ කළේ කොහේ දී ද?
(1) ගලීලයෙන් ය. (2) මිසරයෙන් ය. (3) අසිරියාවෙන් ය. (4) බබිලෝනියෙන් ය.

06. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වූයේ,
(1) සිනගෝගය යි. (2) කපාල පිටිය යි.
(3) ජෙරුසලම් දේව මාලිගය යි. (4) උත්තම පූජක මැදුර යි.

07. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතර සිටි සෙබදිගේ පුතුන් දෙදෙනා වන්නේ,
(1) ජාකොබ් හා සීමොන් ය. (2) මතෙව් හා සීමොන් ය.
(3) ඇන්ඩෘ හා ජාකොබ් ය. (4) ජාකොබ් සහ ජොහාන් ය.

08. සිනගෝගයෙ හි ප්‍රධාන කාර්යය වූයේ,
(1) ශුද්ධ බයිබලය ගැන ඉගැන්වීම යි. (2) ආගමික දැනුම ඉගැන්වීම යි.
(3) දේශනා කිරීම ගැන ඉගැන්වීම යි. (4) යාච්ඤා කිරීම ගැන ඉගැන්වීම යි.

09. (A) මං සන්ධිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීම.
(B) රෝගීන් සුවපත් කිරීම.
(C) අන් අයට නොදැනෙන සේ දන් දීම.
(D) වස්ත්‍රවල ශුද්ධ ලියවිලි පාඨ ලියා ගැනීම.

ඉහත පිළිතුරු අතරින් පරිසිවරුන් හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A හා D ය. (2) A හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

10. ''සැඩොක්'' නැමැත්තකුගෙන් පැවත එන්නේ කවුරුන් ද?
(1) පරිසිවරු ය. (2) සෙලට්වරු ය.
(3) උත්තම පූජකවරු ය. (4) සද්දුසිවරු ය.

11. ''මාගේ ගෘහය .................................. වන්නේ ය. එහෙත් ඔබ එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ.''
මෙහි හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) දේව කැමැත්තේ ගෘහයක් ය. (2) පවිටුන්ගේ ගෘහයක් ය.
(3) යාච්ඤාවේ ගෘහයක් ය. (4) නිවැරදිකරුවන්ගේ ගෘහයක් ය.

12. රජ කෙනෙකු සේ ජයාන්විත ව ජෙරුසලමට පිවිසෙන ජේසුස් වහන්සේ ඒ සඳහා තෝරා ගත්තේ,
(1) නැවුම් කොටළු නාම්බෙකු ය. (2) නැවුම් ගව නාම්බෙකු ය.
(3) නැවුම් බැටළු නාම්බෙකු ය. (4) නැවුම් මුව නාම්බෙකු ය.

13. ජුදයන් අතට පවා දීමෙන් පසු ජේසුස් වහන්සේ පළමු ව රැගෙන යන ලද්දේ,
(1) දේව මාලිගයට ය. (2) රජ මාලිගාවට ය.
(3) සිනගෝගයට ය. (4) උත්තම පූජක මැදුරට ය.

14. ජේසුස් වහන්සේ කුරුස ගසේ දී පැවසූ අවසන් වදන,
(1) මට පිපාස ය.
(2) පියාණනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි.
(3) ඔබ මා සමඟ අද මා පාරදීසයේ සිටින්නේ ය.
(4) මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත් හැරියේ මන් ද?

15. ජේසුස් වහන්සේ මෘත ශරීරය පිලාත් ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලීමට තරම් එඩිතර වූයේ,
(1) අරිමාතියේ ජොසෙප් ය. (2) සිරේනියේ සීමොන් ය.
(3) ස්නාවක ජොහොන් ය. (4) සීමොන් පේදුරු ය.

16. ''මිත්‍රය ඔබේ පව් ඔබට කමා කරන ලද්දේ ය.''
ජේසුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,
(1) දිය උදර රෝගියාට ය. (2) මී මැසිමොර රෝගියාට ය.
(3) ලාදුරු රෝගියාට ය. (4) අංශභාග රෝගියා ට ය.

17. යක්ෂයා විසින් ජේසුස් වහන්සේ ට ගෙනෙන ලද තෙවන පරීක්ෂාවේ දී උන් වහන්සේ දුන් පිළිතුර වන්නේ,
(1) මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය.
(2) නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට පමණක් නමස්කාර කරන්න ය.
(3) නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න ය.
(4) දෙවියන් වහන්සේ පමණක් විශ්වාස කරන්න ය.

18. රූප විපර්යාසය අවස්ථාවේ දී ජේසුස් වහන්සේ සමඟ සිටි ගෝලයන් වන්නේ,
(1) පේදුරු, ඇන්ඩෘ හා ජොහාන් ය. (2) ජාකොබ්, ජොහාන්, හා පිලිප් ය.
(3) පේදුරු, ජොහාන් හා මතෙව් ය. (4) පේදුරු, ජාකොබ් හ ජොහාන් ය.

19. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට පිළිගැන් වූයේ,
(1) ඇරමෙයික් භාෂාවෙන් ය. (2) හෙබ්‍රෙව් භාෂාවෙන් ය.
(3) ග්‍රීක භාෂාවෙන් ය. (4) ලතින් භාෂාවෙන් ය.

20. ''ඔබේ ඉඟ පටිය බැඳ ගන්න. පහන් ද දල්වා තබා ගන්න.''
මෙම ප්‍රකාශයෙන් අවධාරණය කරනුයේ,
(1) දැනුම් දෙන තුරු බලා සිටිය යුතු බව ය.
(2) තීරණාත්මක මොහොතට සූදානමින් සිටිය යුතු බව ය.
(3) ක්‍රියා කිරීමට සූදානම් විය යුතු බව ය.
(4) ඉවසීමෙන් බලා නොසිටිය යුතු බව ය.

21. බබිලෝනියේ සිටි සෑම අතින් ම සරුසාර කානාන් දේශය කරා ජන කණ්ඩායම් සංක්‍රමණය වූයේ,
   (1) ක්‍රිස්තු පූර්ව 17 වන සියවසේ දී ය.   (2) ක්‍රිස්තු පූර්ව 21 වන සියවසේ දී ය.
   (3) ක්‍රිස්තු පූර්ව 18 වන සියවසේ දී ය.   (4) ක්‍රිස්තු පූර්ව 19 වන සියවසේ දී ය.

22. ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ ආලේපනය ලැබූ ජන කණ්ඩායමක් නොවන්නේ,
   (1) රජවරුන් ය.   (2) දිවැසිවරුන් ය.   (3) දිළින්දන් ය.   (4) පූජකවරුන් ය.

23. දුක් විඳින සේවකයාණෝ ආදර්ශනයට ගන්නා කිතුණු අප කළ යුත්තේ,
   (1) තම ජීවිත රැක ගැනීමට ක්‍රියා කිරීම ය.
   (2) දුක් පීඩා මධ්‍යයේ ඇදහිල්ලෙන් හා ධෛර්යයෙන් ක්‍රියා කිරීම ය
   (3) ලෝකයෙන් පැමිණෙන පීඩාවලින් පලා යාම ය.
   (4) දුක් විඳීම අන් අයගෙන් බලාපොරොත්තු වීම ය.

24. ''මම මිනිසුන්ගේ ජීවිතවලට ආදරය කරමි. ඝාතනය හෙලා දකිමි.'' මෙලෙස පැවසූ වේ,
   (1) ගරු මයිකල් ලැප්ස්ලි දේවගැති තුමා ය.
   (2) ගරු තිස්ස බාලසූරිය දේවගැති තුමා ය.
   (3) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු දේවගැති තුමා ය.
   (4) ගරු ජෙරාඩ් ද සිල්වා දේවගැති තුමා ය.

25. දාවිත් රජ පරපුරෙන් මෙසියස් වහන්සේ පැමිණෙන බව දිවැසි වැකි ප්‍රකාශ කරන ලද්දේ,
   (1) යෙසායා දිවැසිවරයා ය.   (2) මලාකී දිවැසිවරයා ය.
   (3) ජෙරමියා දිවැසිවරයා ය.   (4) මීකා දිවැසිවරයා ය.

26. මෙසියස් වහන්සේ තුළ කිතුනු අපගේ බලාපොරොත්තුව වන්නේ,
   (1) දෙවන පැමිණීමේ දී අප සාධාරණ විනිශ්චයකට ලක් කෙරෙන බව යි.
   (2) ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයක් කරා රැගෙන යන බව යි.
   (3) දෙවියන් වහන්සේගේ තේරා ගත් ජනතාවක් ලෙස පිළිගන්නා බව ය.
   (4) පාපයෙන් තොර පූර්ණ විමුක්තිය සහිත නව ජීවිතයක් ලැබෙන බව ය.

27. කමාව පිළිබඳ වැදගත් ම ඉගැන්වීම වන්නේ,
   (1) පළිගැනීම වෙනුවට කමාව අවශ්‍ය බව ය.
   (2) දේව කමාව අත් දැකීමට නම් අන්‍යයන්ට කමා විය යුතු බවය.
   (3) ඉර බසින තුරු කෝපය සිතේ තබා නොගත යුතු බව ය.
   (4) හැත්තෑවාර හතකට සීමාකොට කමාව දිය යුතු බව ය.


28. ප්‍රේමය නොමැත්තා ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට හෝ සමාන කිරීම තුළින් අර්ථවත් කරනුයේ,
   (1) පරිපූර්ණභාවය ය.   (2) උත්කෘෂ්ඨභාවය ය.
   (3) හිස් භාවය ය.   (4) අනර්ඝත්වය ය.

29. ''යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය ........................................................ '' මෙහි හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,
   (1) ''ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය'' ය.
   (2) ''ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය''.
   (3) ''ඔවුන් තෘප්තිමත් වනු ඇත'' ය.
   (4) ''ස්වරග රාජ්‍යය ඔවුන්ගේය'' ය.

30. බහු ආගමික බහු වාර්ගික සමාජයක ජීවත් වන කිතුනු ඔබ ක්‍රියාකළ යුත්තේ,
   (1) එකිනෙකාට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීම ය.
   (2) බහු ආගමික සිරිත් විරිත් ඉටු කිරීම ය.
   (3) විවිධ ජාතීන් ඇසුරු නොකිරීම ය.
   (4) සියලු විශ්වාසයන් සමාන බව සිතිය යුතු ය.

31. ''සමිඳාණන් වහන්ස මේ පාපය මොවුන් පිට නොතැබුව මැන ව.'' මෙසේ යාච්ඤා කළේ,
(1) ජේසුස් වහන්සේ ය. (2) අසීසියේ ෆ්‍රැන්සිස් තුමා ය.
(3) ස්තේපන් තුමා ය. (4) පාවුල් තුමා ය.

32. පහත චරිත අතුරින් සහනාධාර කටයුතුසඳහා පත්කර ලද උපස්ථායක කණ්ඩායමට අයත් චරිත පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,




(1) A, B හා C ය.
(2) A, C හා D ය.
(3) C D හා E ය.
(4) C, D හා F ය.

33. ලොව පුරා වසංගතයක් ඇති වන බවට අනාවැකියක් ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
(1) ක්ලෞදියස් ය. (2) ක්ලෙයොපස් ය. (3) අගබස් ය. (4) අග්‍රිපා ය.

34. කූඩාරම් කර්මාන්තයේ යෙදෙමින් ධර්ම දූත සේවයට ශක්තියක් වූයේ,
(1) අකිල සහ ප්‍රිස්කිලාය. (2) අනනීයස් සහ සපිරාය.
(3) අම්රම් හා ජොකෙබෙත් ය. (4) සිමියොන් හා අන්නාය.

35. පිලිප්පියේ සිරගෙදර අත් අඬංගුවේ සිටි පාවුල්ගේ හා සීලස් ගේ ක්‍රියා කලාපය මඟින් අප ලබන පන්නරය වන්නේ,
(1) සිරගෙයි මුලාදැනියාට විරුද්ධ ව කටයුතු කිරීම ය.
(2) අසාධාරණකම්වලට එරෙහිව ක්‍රියා කිරීම ය.
(3) මුර සෙබළුන්ට පවා දේශනා කර දහමට ගැනීම ය.
(4) දුක් පීඩා මධ්‍යයේ වුව ද දෙවියන්ට ප්‍රසංශා කර යාච්ඤා කිරීම යි.

36. ''මාගේ නාමය විජාතීන් ද රජුන් ද ඊශ්‍රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යෑමට මා විසින් තෝරා ගන්නා ලද භාජනයකි''

| | | | |
|---|---|---|---|
| A | දෙවියන් වහන්සේ | D | අනනියස් |
| B | සාවුල් | E | ජේසුස් වහන්සේ |
| C | සීලස් | F | බර්ණබස් |

ඉහත ප්‍රකාශය හා සම්බන්ධ චරිත පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) A, B හා C ය. (2) B, D හා E ය. (3) B, C හා D ය. (4) A, B හා F ය.

37. ජෙරුසලම් මන්ත්‍රණ සභාව විසින් ගනු ලැබූ තීරණයක් නොවන්නේ,
(1) කාමමිත්‍යාචාරයෙන් වැළකීම ය.
(2) බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් අනුභවයෙන් වැළකීම ය.
(3) විජාතීන් චර්ම ඡේදනය කිරීම යි.
(4) රූප සම්බන්ධ දූෂ්‍යකම්වලින් වැළකීම යි.

38. එපීසිය මුල් කරගෙන පාවුල් තුමා ගමන් ගත් ධර්මදූත චාරිකාව වන්නේ,
(1) තෙවන ගමන ය. (2) පළමු ගමන ය.
(3) යායිරස් ය. (4) නිකදේමුස් ය.

39. කායිසාරියේ සිටි දෙවියන් වහන්සේට නොකඩවා යාච්ඤා කළ රෝම නිලධාරියා වන්නේ,
(1) නිකනෝර් ය. (2) කොරනේලියස් ය.
(3) යායිරස් ය. (4) නිකදේමුස් ය.

40. රෝම ගමන සඳහා පාවුල් තුමා සමඟ එක් වූයේ
(1) සීලස් හා තිමෝතියස් ය. (2) ලූක් හා තිමෝතියස් ය.
(3) ලූක් හා සීලස් ය. (4) ලූක් හා අරිස්තාර්කස් ය.

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test -2025**

**11 ශ්‍රේණිය** | **ක්‍රිස්තියානි ධර්මය - II** | කාලය පැය 02 යි මිනිත්තු 10 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   (1) විශේෂ උපත් වලට අදාළ ව වැදගත් වන්නා වූ පුද්ගල චරිත දෙකක් ලියන්න.
   (2) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව සඳහන් කරන උපමා කතා දෙකක් ලියන්න.
   (3) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට ලබා දීමෙන් පොරොන්දු වූ විශාල දරුපරපුර සමාන කරන ලද්දේ කුමන දේවල් වලට ද?
   (4) ප්‍රේමය හැඳින්වීම සඳහා භාවිත කරන ලද හෙබ්‍රෙව් සහ ග්‍රීක වචන දෙක ලියන්න.
   (5) දසපනතෙහි අඩංගු පොරොන්දුවක් සහිත පනත කුමක් එහි කී වෙනි පනත ද?
   (6) මෙසියානු සංකල්පය හා බැඳි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
   (7) ''රන්වත් රිදීවත් මට නැත එහෙත් මට ඇති දේ ඔබට දෙමි.'' මෙම ප්‍රකාශනය හා සම්බන්ධ ශ්‍රාවකයන් නම් කරන්න.
   (8) කිතුණු සහා එකමුතුව සඳහා පිහිටුවා ඇති ආයතන දෙකක් ලියන්න.
   (9) ශුද්ධකමේ ජීවිතයක ලක්ෂණ 02 ක් ලියන්න.
   (10) කිතුණු අනුගාමිකයන්ට මුලින් ම ක්‍රිස්තියානි යන නාමය ලැබුණේ කොහේදී ද? ප්‍රථමවේද සාක්ෂිකයා කවු ද?

(ලකුණු 2 × 10 = 20)

02. (i) දේව රාජ්‍යයේ නායකත්වය දැරීම සම්බන්ධයෙන් ජේසුස් වහන්සේ පුරවැසියන්ට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.
   (ii) ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශනයෙන් පෙන් වූ අවස්ථා 03 ක් ලියන්න.
   (iii) දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් අපේක්ෂිත චරිත ලක්ෂණ පහක් ලියා විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

03. (i) පැරණි ගිවිසුමේ සඳහන් එඬේර චරිත ගතකළ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න.
   (ii) යහපත් එඬේරෙකු සතු ගුණාංග 03 ක් ලියන්න.
   (iii) ජේසුස් වහන්සේ තුළ දිස් වූ එඬේර ගුණාංග චරිතායනය කරමින් වර්තමාන කිතුණු නායකයින් තම මෙහෙය ඉටු කළයුතු ආකාරය කරුණු පහකින් පැහැදිලි කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

04. (i) කමාවීම සම්බන්ධව ආදර්ශයෙන් පෙන් වූ මෑත කාලීන දේවගැති චරිත දෙකක් ලියන්න.
   (ii) ජේසුස් වහන්සේ කමාවීම සම්බන්ධව කළ ඉගැන්වීම් තුනක් ලියා දක්වන්න.
   (iii) ''දෙවියන් වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔබට කමාකළාක් මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න.''මෙම ශික්ෂණයෙහි පිහිටා නිවසේ ද පාසලේ දී හා සමාජයේ දී ද ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

05. (i) ජුදා පෙන්තකොස්ත මංගල්‍යය හා කිතුනු පෙන්තකොස්ත මංගල්‍යය හඳුන්වන්න.

(ii) ශුද්ධාත් ම බලයෙන් නව ජීවයක් ලැබූ කිතුනුවන් නමස්කාරීය ජීවිතයේ යෙදුණු ආකාර 03 ක් ලියන්න.

(iii) මුල් කිතුනු සභාව ධර්මදානය මෙහෙවරෙහි හා සුබ සාධක මෙහෙවරෙහි යෙදුණු ආකාරය මගින් අද කිතුනු සභාව ලබන පන්නරය කරුණු 05 කින් විස්තර කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

06. (i) පළමු ධර්මදූත චාරිකාව සඳහා පාවුල් තුමා සමඟ සහභාගී වූ දෙදෙනෙක් නම් කරන්න.

(ii) හවුල් නායකත්වය තුළ ධර්මදූතයකයින් තම සේවාවන් සිදු කළ ප්‍රධාන නගර තුනක් නම් කර එම ස්ථාන වලදී සිදු වූ විශේෂ සිදුවීම බැගින් ලියන්න.

(iii) සාර්ථක ලෙස දේව මෙහෙවරෙහි යෙදෙන කිතුණුවන් ට පළමු ධර්මදූත ගමනෙන් ලබා ගත හැකි ආදර්ශ 05 ක් කෙටියෙන් පහදන්න.

(ල. 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටිසටහන් ලියන්න.

(i) ශ්‍රාවකයන්ගේ ධර්මදූත චාරිකා.

- ★ ශ්‍රාවකයන් (ප්‍රේරිතයන්) යනු කවුදැයි හැඳින් වීම.
- ★ ධර්ම දූත චාරිකාවලට ශ්‍රාවකයන් පිටත් කර යැවීමේ දී ඔවුන්ට දුන් උපදෙස්
- ★ ධර්ම දූත චාරිකාවල දී ශ්‍රාවකයන්ට පැවරුණු කාර්යයන්
- ★ ධර්ම දූත චාරිකා තුළ ශ්‍රාවකයන් ක්‍රියා කළ අයුරු
- ★ ධර්ම දූත චාරිකාවේ ප්‍රතිඵල

(ii) දුක් උසුලන සේවකයාණෝ,

- ★ පැරණි ගිවිසුමේ දුක් ඉසුලු චරිත හැඳින්වීම.
- ★ යෙසායා දිවැසිවරයා දුක් ඉසිලූ සේවකයාණන් ගැන පවසා ඇති කරුණු
- ★ නව ගිවිසුමේ දුක් උසුලන සේවකයා හා එතුමාගේ ක්‍රියා කලාපය.
- ★ දුක් විඳීම සම්බන්ධන නව ගිවිසුමේ ඇති ආකල්ප
- ★ එමගින් අපට ලබා දෙන ආදර්ශ

(iii) ධර්මදූත සේවක පාවුල් තුමා

- ★ පාවුල්තුමා හැඳින්වීම සඳහා භාවිතා කළ හෙබ්‍රෙව් ග්‍රීක හා රෝම නම්.
- ★ පාවුල් තුමාගේ උපත හා පවුල් පසුබිම.
- ★ සිත් හැරී සිදුවීමට පෙර පාවුල් තුමාගේ ක්‍රියා කලාපය
- ★ සිත් හැරීමෙන් පසු පාවුල් තුමාගේ සාක්ෂි දැරීමේ මෙහෙවර
- ★ පාවුල් තුමාගේ ජීවිතය හා සේවය තුළින් කිතුණු සභවට ලබාදෙන ආදර්ශ

(iv) ජුදා සමාජ දැක්ම

- ★ ජුදා සමාජය බිහිවීමට පුරෝගාමී වූ චරිත
- ★ ඔවුන්ගේ ජීවිතවල දක්නට ලැබෙන ගුණාංග
- ★ ජනතාවට ජාතියක් ලෙස ගොඩනැගීමට දුන් දායකත්වය
- ★ කිතුනු දැක්මට ජේසුස් වහන්සේගේ ඉගැන්වීම වලින් ලද මඟපෙන් වීම.

(ලකුණු 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (1) | 04. (3) | 05. (1) | 06. (3) | 07. (4) | 08. (2) | 09. (1) | 10. (4) |
| 11. (3) | 12. (1) | 13. (4) | 14. (2) | 15. (1) | 16. (4) | 17. (3) | 18. (4) | 19. (1) | 20. (2) |
| 21. (4) | 22. (3) | 23. (2) | 24. (3) | 25. (1) | 26. (4) | 27. (2) | 28. (3) | 29. (4) | 30. (1) |
| 31. (3) | 32. (2) | 33. (3) | 34. (1) | 35. (4) | 36. (2) | 37. (3) | 38. (1) | 39. (2) | 40. (4) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (1) සෙකරියස් පූජක තුමා / ජෝසප්තුමා / මරියතුමිය. / එළිසබෙත් තුමිය.
(2) අබ ඇටයේ උපමාව/ මුහුන් පිළිබඳ උපමාව වපුරන්නාගේ උපමාව
(3) පොළොවේ දූවිලි / අහසේ තාරකා
(4) හෙබ්‍රෙව් - ශාලෝම් / ග්‍රීක - අයිරේනියා
(5) නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝකාලයක් ජීවත් වෙන්න.
(6) ★ මෙසියස් වහන්සේගේ රජ්‍යය සදාකාලික බව
★ සාධාරණත්වය හා යුක්තිය පැවතීම.
★ අසිරිමත් උපදේශකයාණෝ
★ සාමයේ කුමාරයාණෝ
(7) පේදුරු සහ ජොහාන්
(8) NCCSL - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
CBS - ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය
YWCA - තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය
CWF - ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය.
(9) ★ තෘෂ්ණාවලට වහල් නොවීම. ★ දේව ගරුබිය ඇති ව ජීවත් වීම.
★ තමකම නැසීම. ★ නිෂ්ඵල ජීවිත මාර්ග වලින් මිදීම.
★ හැසිරීමෙන් ශුද්ධව සිටීම.
(10) සිරියාවේ අන්තියෝකියේ දී / ස්තේපන් තුමා

(ල. 2 x 10 = 20)

02. (i) ★ ශ්‍රේෂ්ඨම තැනැත්තා වේ. ★ නායකයා සේවකයා විය යුතු ය.
★ අන් අය කෙරෙහි බලය පෑමට අවසර නැත.
(ii) ★ කුඩා දරුවෙකු අගය කිරීම.
★ සේවය අවශ්‍ය අය තමා වෙතට එනතුරු නොසිට සේවය කිරීම සඳහා ඔවුන්ගේ නිවෙස් වෙත යෑම.
★ ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
★ බොහෝ දෙනෙකුගේ මිදීම පිණිස නිහතමානී ව සිය ජීවිතය පිදීම.
(iii) ★ අන් අයවෙනුවෙන් වැය වීම.
★ ජාති ආගම් කුල පන්ති බේද නොතකා ක්‍රියා කිරීම.
★ අන් අයගේ ජීවිත යහපත් අයුරින් වර්ධනය කිරීමට කටයුතු කිරීම.
★ තම කැඳවීමට නිසි ප්‍රතිචාර දැක්වීම.
★ ජේසුස් වහන්සේට ප්‍රසන්න වන අයුරින් මුළු හදවතින් කැප වී සේවය කිරීම. (පිටුව 106 - 107)

(ල. 2 + 3 + 5 = 10)

03. (i) ★ ආබෙල් ★ ජාකොබ් ★ දාවිත්
(ii) ★ පෝෂණය කිරීම. ★ මඟ පෙන්වීමය.
★ සොයායෑම, රැකබලා ගැනීම. ★ හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, ජීවිතය කැප කිරීම.
(iii) ★ සමාජයෙන් බැහැරව ගිය පුද්ගලයින් ගැන විශේෂ සැලකිල්ලක් දැක්වීම.
★ ඔවුන්ට සාමය දානය කරමින් නැවත රැළට එකතු කර ගැනීම.
★ ජනතාවගේ සියලු අවශ්‍යතා ගැන සැලකිලිමත් වීම.
★ කුඩා දරුවන් තරුණ තරුණියන් ගැන විශේෂ අවධානය යොමු කිරීම හා නොමඟට යාමට ඉඩ නොතැබීම.
★ සමාජය තුළ අසරණභාවයට පත් ව සිටින්නන් පිළි ගැනීම සහ ඔවුන්ට උපකාර කිරීම.

(ල. 2 + 3 + 5 = 10)

04. (i) ★ දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ ★ ගරු ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා
(ii) ★ ස්වාමීන්ගේ යාච්ඤාවේ ''අපට වරද කරන අයට අප කමාවන්නාක්මෙන් අපේ වරදට කමා කළ මැනව.
★ පේදුරුතුමා විසින් නගන ලද ප්‍රශ්නයට පිළිතුරු ලෙස සත්වාරයක් නොව සත්වාර සැත්තෑවක් සමාන විය යුතු බව.
★ කමා නොවූ දාසයා පිළිබඳ ඉගැන්වීම.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(iii) නිවසේ දී -
- ★ සහෝදර සහෝදරයින් සමඟ සිදුවන වැරදි වලට කමාව දෙමින් සහයෝගයෙන් කටයුතු කිරීම.
- ★ දෙමාපිය වැඩිහිටියන්ගේ අවවාද උපදෙස් පිළි පදිමින් වරදක් පෙන්වා දුන් විට එය නිවැරදි කර ගනිමින් කටයුතු කිරීම.

පාසලේ දී -
- ★ තම මිතුරු මිතුරියන් සමඟ කටයුතු කිරීමේ දී ඔවුන්ගෙන් හා ඔවුන්ට සිදුවන වැරදිවලට සමාව ගනිමින් හා සමාව දෙමින් කටයුතු කිරීම.

සමාජයේ දී -
- ★ තම අසල්වැසියන් නෑදැයන් හිතවතුන් අතින් වරදක් අතපසුවීමක් සිදු වූවහොත් එයට කමාව දීම හා ගැනීම.

සිසුන් සපයා ඇති පිළිතුරු සලකා බල ලකුණු ලබා දෙන්න. (ල. 2 + 3 + 5 = 10)

05. (i) ජුදා පෙන්තකොස්ත මංගල්‍ය - ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයකි.
කිතුනු පෙන්තකොස්ත මංගල්‍යය - කිතුනු සභාවේ ආරම්භය සිදු වූ දවස, ගෝලයන්ට ශුද්ධාත්ම බලය ලැබීම.

(ii)
- ★ දිනපතා නොකඩවා එක් සිත් ව දේව මාලිගාවේ රැස්වීම.
- ★ ගෙයින් ගෙට ගොස් රොටී කැඩීම.
- ★ ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහි පැවතීම.
- ★ සහභාගීකම පැවැත්වීම.

(iii)
- ★ දේශනා කිරීම තුළින් සුබාරංචිය ව්‍යාප්ත කිරීම.
- ★ රෝගාතුර වූවත් හා දුෂ්ඨ ආත්මයාණන්ගෙන් ජීවිත වුවත් සුව කිරීම තුළින් ජනතාවට සුවය සහනය සැලසීම
- ★ සියල්ල පොදුවේ තබා ගැනීම තුළින් සමානාත්මතාවය සමාජගත කිරීම.
- ★ දේව මඟපෙන්වීම සොයමින් යාච්ඤා කිරීම.
- ★ හැකියා දක්ෂතා සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම.

(ල. 2 + 3 + 5 = 10)

06. (i) බාර්ණබස්, ජොහාන් මාක්

(ii) ★ පාපස්
බුද්ධිමත් රෝම දේශාධිතියෙකු වූ සර්ගියස් පාවුලස් නැමැත්තාට සත්‍යකරා යොමු වීමට ඔහුගේ පෞද්ගලික ඉන්ද්‍රජාලියෙකු වූ එළිමස් මැගෝස් ඉඩ නොදුන් අතර අම්හිරි අත්දැකීමත් තුළින් පාවුල් ගේ හා බර්ණබස්ගේ යහපත් හවුල් නායකත්වය තුළ සත්‍ය අවබෝධය කරා ගෙන ඒමට හැකිවීම.
★ පිසිදියේ අන්තියෝකිය
පාවුල් හා බර්ණබස් හවුල් නායකත්වය තුළ ධර්ම ශාලාවේ දීර්ඝ ලෙස දේශනා කිරීම, බොහෝ දෙනෙක් අදහා ගැනීම ඊළඟ සබත් දිනවල දී ද දේශනා කිරීමට ආරාධනා කිරීම.
★ ලුස්ත්‍රාව
පාවුල් හා බර්ණබස් විසින් උපන්දා පටන් කොරව සිටි මිනිසෙකුට සුවය ලබා දීම, බර්නබස් හා පාවුල් දෙවිවරුන් යැයි වැඳුම් පිඳුම් කිරීමට සූදානම් වීම.

(iii)
- ★ අභියෝග මැද දී වුව ද ශුද්ධාත්මයාණන් වහන්සේ මඟ පෙන්වන ආකාරයෙන් නායකත්වය ගෙන ක්‍රියා කිරීම.
- ★ හැම විටම සාමූහිකව කටයුතු කිරීම තුළින් අභියෝග ජයගත හැකි බව.
- ★ විවිධ මතවාද මත ගැටුම්වල දී ද වැරදි අදහස් සමාජය තුළ ප්‍රචලිත වීමේ දී දේව දරුවෙකු ලෙස නිර්භීතව ධර්මදූතයන් මෙන් ක්‍රියා කරමින් ලිපි ලේඛන හා විද්‍යුත් මාධ්‍ය තුළින් නිවැරදි දේ සමාජ ගත කිරීම.
- ★ සැම විටම ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම සෙවීම.
- ★ හැමවිමට කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම හා සාකච්ඡාවෙන් තීරණවලට එළැඹීම.

(ල. 2 + 3 + 5 = 10)

07. (1) <u>ශ්‍රාවකයන්ගේ ධර්ම දූත චාරිකා</u>
ශ්‍රාවකයන් යනු කවු ද? (ප්‍රේරිත)
- ★ විශේෂ මෙහෙය සඳහා පුහුණුකර යැවූ කණ්ඩායම

ශ්‍රාවකයන්ට දුන් උපදෙස්
- ★ සැරයටියක්, මල්ල, රොටී, මිල මුදල්
- ★ කමිස 02 ක් රැගෙන නොයෑම.
- ★ චාම් පැවැත්මක් පවත්වා ගත යුතු විය.
- ★ සුබ අස්න පිළිගන්නා අය සමඟ නිතරම සිටින්න.
- ★ නොපිළිගන්නා අයගේ ඉවත් වන්න. පාද වලින් දූවිලි ගසා දමන්න.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

ශ්‍රාවකයන්ට පැවරූ කාරියයන්
- ★ යක්ෂයාගේ බලය හ සියලු ආධිපත්‍ය කෙරෙහි බලය පැවරුම් ලැබ, රෝග සුව කිරීමේ වරම සහිත දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම.
- ★ සේවකයන් ඉල්ලා යාච්ඤා කරන්න.
- ★ නිවෙස්වලට සාමය පැතීම.
- ★ රෝගීන් සුව කිරීම.
- ★ දෙවියන් වහන්සේගේ රාජ්‍ය පැමිණ ඇති බව දැන්වීම.

ශ්‍රාවකයන් ක්‍රියා කළ අයුරු
- ★ ප්‍රමාද නොවී සුබ අස්න දේශනා කිරීම.
- ★ විවිධ අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීම. (වගවලසුන් මැදට යවමි.)
- ★ චාම් දිවි පෙතක් ගතකිරීම හා දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසයෙන් රැඳීම.

ධර්මදූත චාරිකාවේ ප්‍රතිඵලය
- ★ රට පුරා සුබ අස්න ප්‍රකාශ වීම. ★ දෙවියන් වහන්සේගේ නාමය තුළ රෝගීන් සුවය ලැබීම.
- ★ දුෂ්ට ආත්ම යටත් වීම.

(ii) <u>දුක් උසුලන සේවකයාණෝ</u>

පැරණි ගිවිසුමේ දුක් ඉසිලූ චරිත
- ★ ජෝබ් තුමා. - ගේ දොර ඉඩකඩම් ඔටුවන් ආදී සියලු දේ අහිමිවීම. / කුෂ්ඨ රෝගයකින් පීඩා විඳීම / සියල්ල ඇදහිල්ලෙන් දරා ගැනීම.
- ★ ජෙරමියා - සිරගෙදර තිබූ මඩ පිරුණු ළිඳක දවස් ගණනක් කෑම නැති ව සිටීම. / ඇදැහිල්ලෙන් යුක්තව ක්‍රියා කිරීම නිසා දිවි බේරා ගැනීම.

යෙසායාගේ දිවැස්වැකිය
- ★ එතුමාණෝ දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටි.
- ★ සැර පරුෂ ලක්ෂණ වෙනුවට මෘදු ලීලාවකින් සැරසී සිටීම.
- ★ දුක් හා වද වේදනා දරයි.

නව ගිවිසුමේ දුක උසුලන සේවකයා
- ★ ජේසුස් වහන්සේ උන් වහන්සේ මිනිසාට තිබූ ප්‍රේමය නිසා මනුෂ්‍යයාගේ පව් වෙනුවෙන් සියලු දුක් පීඩා දරා දිවි පිදු කිරීම.

නව ගිවිසුමේ ඇති ආකල්ප
- ★ දුක් විඳීමෙන් පලා නොයා එය ප්‍රීතියෙන් භාර ගැනීම, ජයග්‍රහනයක් සේ සැලකීම

ආදර්ශ
- ★ අන් අයට ප්‍රේම කිරීම. ★ මමත්වයෙන් තොරව ජීවත් වීම.
- ★ පරාර්ථකාමී සේවකත්වයට යොමු වීම.

(iii) <u>ධර්මදූත සේවක පාවුල්තුමා</u>

හෙබ්‍රෙව් නම - සාවුල් ග්‍රීක නම - පාවුල් රෝම නම - පාවුලස්
- ★ පාවුල්තුමාගේ උපත සිදුවන නගරය තාර්සස් මෙය වානිජ නගරයක්, විශාරදයන්, දර්ශන වාදීන් බොහෝ ධනවතුන් ජීවත් වූ විශ්ව විද්‍යාල බොහෝමයක් පිහිටි නගරයක්, පාවුල් තුමා ජුදෙව් පිරිසියෙක් මෙතුමාට පරම්පරාවෙන් රෝම පුරවැසි භාවය ලැබී තිබිනි. මෙතුමා ජුදෙව් මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙක්.
- ★ පාවුල් තුමා කිතුණුවන්ට පීඩා කළ අයෙක් කිතුණු ස්ත්‍රීන් හා පුරුෂයින් අල්ලා සිර භාරයට ගැනීමටත් ඔවුන් විනාශ කිරීමටත් උත්තම පූජකයාගෙන් අවසරපතක් ගෙන දමස්කයට යන මාර්ගයේ දී ජේසුස් වහන්සේ දර්ශනය වීමෙන් හැරීම සිදුවිය.
- ★ පාවුල්තුමා විවිධ පුද්ගලයන් සමඟ ධර්මදූත චාරිකා හතරකට සහභාගී වෙමින් බොහෝ දෙනා අතරට ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන සුභාරංචිය රැගෙන යමින් බොහෝ අරුම පුදුම දේවල් හා ප්‍රාතිහාර්යයන් සිදු කරමින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරූ හ.
- ★ සෑම විටම ශුද්ධාත්ම මඟපෙන්වීම සෙවීම.
- ★ සාක්ෂි දැරීම.
- ★ කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම.
- ★ අභියෝගවලට මුහුණ දීම.
- ★ අභියෝග මධ්‍යයේ ශක්තිමත් වීම.

(iv) **ජුදා සමාජ දැක්ම.**
- ★ ආබ්‍රහම් / මෝසෙස් / ආදී පීතෘවරුන් (ඊශාක් / ජාකොබ්)
- ★ ඇදහිල්ල / කීකරුකම / විශ්වාසය / දේව භය / යටහත් පහත්කම)
- ★ දස පනත මගින් විනයගරුක සමාජයක් බිහි වීම.
- ★ ජේසුන් වහන්සේ සමාජය තුළ දෙවියන් ට ගරුකිරීම, කීකරු වීම හා මනුෂ්‍යයන් අතර සබඳතාවය.
- ★ ජේසුස් වහන්සේ උපමා කතා ප්‍රාතිහාර්ය දේව රාජ්‍යයේ ලකුණු හා ජීවිත ආදර්ශය මගින් ජුදා දැක්ම තුළින් කිතුණු දැක්මට මඟ පෙන් වූ සේක

(ල. 5 + 5 = 10)